මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

**මාධ්‍ය නිවේදන අංක :LAE/2025/81** **2025.04.30**

# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025.05.06

## නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා බෙදාහැරීම අවසන් බව සහ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව ලබා ගැනීම පිළිබඳව දැන්වීම

පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා ගෘහ වෙත තැපැලෙන් බෙදාහැරීමේ කටයුතු 2025.04.29 දින අවසන් කර ඇත. නිල ඡන්ද දැන්වීම් පත් නොලැබුණු ඡන්ද හිමියන්ට 2025 මැයි මස 06 දින දක්වා කාර්යාල වේලාව තුළ දී ඔවුන් ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි ලිපිනයට අදාළ ප්‍රදේශයේ තැපැල් කාර්යාලය වෙත ගොස් ස්වකීය අනන්‍යතාව ප්‍රකාශ කිරීමෙන් අනතුරුව තම ගෘහයට අදාළ නිල ඡන්ද දැන්වීම්පත් ලබා ගැනීමට හැකියාව පවතී.

නිල ඡන්ද දැන්වීම්පතක් නොලැබුණු ඡන්ද හිමියන්ට නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවේ පිටපතක් පහත පියවර අනුගමනය කිරීමෙන් මාර්ගගත ක්‍රමයට ලබාගැනීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් පහසුකම් සලසා තිබේ.

https://eservices.elections.gov.lk යොමුව හරහා මැතිවරණ ඉ සේවා වෙත පිවිස එහි "පුරවැසියන් සඳහා" සඳහා වන යොමුවෙන් "මැතිවරණය සඳහා ඡන්ද හිමි ලියාපදිංචි තොරතුරු" ඉ සේවාව වෙත පිවිස තම හැඳුනුම්පත් අංකය ඇතුළත් කර I'm Not a Robot යන්න ඉදිරියේ ☑ සලකුණ යොදා "පෙන්වන්න" යන බොත්තම එබීම මගින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025 ට අදාළ ඡන්ද හිමි ලියාපදිංචි තොරතුරු ලැබේ.

එහි පහළින් ඇති "ජංගම දුරකතන අංකය :" යන ස්ථානයට ඔබගේ ජංගම දුරකතන අංකය ඇතුළත් කොට I'm Not a Robot යන්න ඉදිරියේ ☑ සලකුණ යොදා "ඡන්ද දැන්වීම් පත්‍රිකාව මුද්‍රණය" යන බොත්තම එබූ විට ලැබෙන තිරයේ ඇති "Enter the Code" යන ස්ථානයට ඔබගේ ජංගම දුරකතන අංකයට ලැබෙන කේතය ඇතුළත් කොට I'm Not a Robot යන්න ඉදිරියේ ☑ සලකුණ යොදා "Submit" බොත්තම එබීම මගින් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව ඉතා පහසුවෙන් බාගත කළ හැකිය.

**ec.lk/vre** යොමුව මගින් හෝ හෝ පහත QR කේතය පරිලෝකනය මගින් මෙම ඉ සේවා ව වෙත පහසුවෙන් පිවිසිය හැකිය.

**එසේම ඡන්ද හිමියන්ට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා නිල ඡන්ද දැන්වීම්පත අනිවාර්ය අවශ්‍යතාවක් නොවන අතර, 2024 පළාත් පාලන ආයතන ඡන්දහිමි නාමලේඛනයේ නම සඳහන් වලංගු හැඳුනුම්පතක් සහිත ඕනෑම ඡන්ද හිමියෙකුට තමාට වෙන්කර ඇති ඡන්ද පොළ වෙත ගොස් අනන්‍යතාව සනාථ කිරීම ප්‍රමාණවත් බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.**

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්